00938

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
විද්‍යාවේදී / අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව
අවසාන පරීක්ෂණය 2016 / 2017
**MCU1108 - ඔබගේ කාර්යය සහ සේවකයන් කළමනාකරණය**

කාලය පැය දෙක (02)යි.

| දිනය : 2017.08.10 | වේලාව : පෙ.ව.9.30 - පෙ.ව.11.30 |
|---|---|

උපදෙස් :

- ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

01. (අ) "කළමනාකරණ ක්‍රියාවලිය" යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? රූපසටහන් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(ආ) සැලසුම්කරණය වැදගත් වන්නේ ඇයි? කළමනාකරණයේ සැලසුම් ශ්‍රිතයේ විවිධ පියවරයන් කවරේද? (ලකුණු 08)

(ඇ) ඔබට කැමැති ව්‍යාපාරික සංවිධානයක් ශ්‍රී ලංකාව ඇසුරෙන් තෝරා ගෙන එම සංවිධානයේ භාවිතා කරන විවිධ කළමනාකරණ සැලසුම් වර්ග මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

02. (අ) කළමනාකරණ කුසලතා යන්නෙන් කුමක් අදහස් කරයිද? තෝරාගත් සංවිධානයක් ඇසුරෙන් විවිධ කළමනාකරණ මට්ටම් හා ඔවුන් සතු කුසලතා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ආ) ව්‍යාපාර සංවිධානයක විවිධ කළමනාකරණ මට්ටම්වල යුතුකම් හා වගකීම් කවරේද? (ලකුණු 08)

(ඇ) "කාර්යක්ෂම හා ඵලදායී තීරණ ගැනීම සංවිධානයක පරමාර්ථ සාර්ථකව මුදුන් පමුණුවා ගැනීමට ඉවහල් වේ."
ඔබ ඉහත ප්‍රකාශයට එකඟ වන්නේද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 10)

03. අතීතයේ සිට වර්තමානය තෙක් වර්ධනය වෙමින් පැවත ආ, ව්‍යාපාර ආයතනයන්හි ක්‍රියාත්මක වන කළමනාකරණ ප්‍රවේශයන් ලුහුඬින් පැහැදිලි කරන්න. (ලකුණු 25)

04. (අ) මානව සම්පත් සැලසුම්කරණය යනු කුමක්ද? (ලකුණු 05)

(ආ) මානව සම්පත් සැලසුම්කරණයේ අදියරයන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ඇ) සංවිධානයකට පුද්ගලයන් ආකර්ශණය කර ගැනීමේ ක්‍රම මොනවාද? සුදුසු උදාහරණ යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

05. "ව්‍යාපාර සංවිධාන සහ පරිසරය අතර සමීප හා අබන්ධ අන්තර් සම්බන්ධතාවයක් පවතී."

(අ) ඔබ ව්‍යාපාර සංවිධානයක පරිසරය වර්ග කරන්නේ කෙසේද? (ලකුණු 05)

(ආ) සංවිධානයක් පරිසරය සමඟ අන්තර් ක්‍රියා කරනු ලබන්නේත්, පරිසරය මත රඳා පවතින්නේත් කුමන ආකාරයෙන්ද යන්න සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුරට සංවිධාන පරිසරයේ ප්‍රධාන උපාංග ඇතුලත් විය යුතු වේ. ඔබගේ පිළිතුරට උපකාරීවීම සඳහා උදාහරණයක් යොදා ගන්න. (ලකුණු 20)

06. පහත සඳහන් දෑ පිළිබඳ කෙටිසටහන් ලියන්න.

(අ) කළමනාකරුවකුගේ සමාජ වගකීම
(ආ) තීරණ ගැනීම සම්බන්ධ සම්භාව්‍ය ආකෘතිය
(ඇ) මෙහෙයුම් කළමනාකරණය
(ඈ) ව්‍යවසායකයකු ලෙස කළමනාකරුවකුගේ භූමිකාව
(ඉ) සංවිධානයකට සංස්කෘතියේ වැදගත්කම (5 x 5 = ලකුණු 25)

- හිමිකම් ඇවිරිණි -